අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv.Level) Examination, 2024

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தொடர்பாடலும் ஊடகக் கற்கையும் I
Communication and Media Studies I

29 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුරු තෝරාගෙන, උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

1. සම්ප්‍රේෂණය හා ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය තාක්ෂණික ලෙස විග්‍රහ කර ඇති සන්නිවේදන ආකෘතිය වන්නේ,
   (1) ශ්‍රාම් හා ඔස්ගුඩ් ආකෘතිය
   (2) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය
   (3) ශැනන් හා වීවර් ආකෘතිය
   (4) ඇරිස්ටෝටල් ආකෘතිය
   (5) ඩේවිඩ් කේ. බර්ලෝ ආකෘතිය

2. “මානව සම්බන්ධතා පවත්වා ගැනීමේ හා වර්ධනය කිරීමේ යාන්ත්‍රණය සන්නිවේදනය” ලෙස විග්‍රහ කරන ලද්දේ,
   (1) වෝල්ටර් ලිප්මාන් ය.
   (2) චාර්ස් කූලී ය.
   (3) ජෝන් ඩුවී ය.
   (4) විල්බර් ශ්‍රාම් ය.
   (5) කර්ට් ලෙවින් ය.

3. පළමුවන ලෝක යුද්ධයේ දී භාවිත කළ ප්‍රචාරණ ක්‍රම පිළිබඳ අධ්‍යයනය කරමින් සන්නිවේදන ආකෘතියක් ඉදිරිපත් කරන ලද්දේ,
   (1) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.
   (2) ශැනන් හා වීවර් ය.
   (3) ඇරිස්ටෝටල් ය.
   (4) විල්බර් ශ්‍රාම් ය.
   (5) චාල්ස් ඔස්ගුඩ් ය.

4. මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ සංකල්පය නිර්මාණය කිරීමෙහිලා දායකත්වය ලබාදුන් සන්නිවේදන විද්වතා කවුරුන් ද?
   (1) විල්බර්ශ්‍රාම්
   (2) මාශල් මැක්ලූහන්
   (3) වෝල්ටර් ලිප්මාන්
   (4) ඊ.බී. ටයිලර්
   (5) බී. මැලිනෝව්ස්කි

5. පහත ආකෘතියේ P,Q,R මගින් පිළිවෙළින් නිරූපණය වන්නේ,

සන්නිවේදකයා → P → මාධ්‍ය → Q → R

(1) ග්‍රාහකයා, අග්‍රස්ථානය, බලපෑම වේ.
(2) සන්දේශය, ග්‍රාහකයාව බලපෑම වේ.
(3) සන්දේශය, බලපෑම, ග්‍රාහකයා වේ.
(4) තොරතුරු මූලාශ්‍රය, ග්‍රාහකයා, අග්‍රස්ථානය වේ.
(5) තොරතුරු මූලාශ්‍රය, සම්ප්‍රේෂකය, ආකේතකරණය වේ.

6. බස් රථයෙන් ගමන් කරමින් සිටි සාරා එහි ගුවන්විදුලියෙන් වාදනය වූ ඇගේ ප්‍රියතම ගීතයකට සවන් දුන්නාය. ගීතය අවසානයේ නිවේදකයා වේලාව ප්‍රකාශ කළේ ය.

මෙම අවස්ථාවේ සිදු වූ සන්නිවේදන කාර්යයන් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) අධ්‍යාපනය හා පෙළඹවීම යි.
(2) පෙළඹවීම හා තොරතුරු සම්පාදනය යි.
(3) විනෝදාස්වාද සම්පාදනය හා පෙළඹවීම යි.
(4) තොරතුරු සම්පාදනය හා අධ්‍යාපනය ලබා දීම යි.
(5) විනෝදාස්වාද සම්පාදනය හා තොරතුරු සම්පාදනය යි.

7. යුනෙස්කෝ සංවිධානය මගින් ඉදිරිපත් කළ ගෲන්වල්ට් ප්‍රකාශනය මගින් අවධාරණයට ලක් නොවූ කරුණ වන්නේ,

(A) මාධ්‍යයේ අහිතකර බලපෑමෙන් ළමා පරපුර මුදවා ගැනීම
(B) මාධ්‍ය සාක්ෂරතාවයෙන් යුතු පුද්ගලයන් බිහි කිරීම
(C) වැඩිහිටියන්ට සුදුසු අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
(D) තරුණ පරපුර විචාරශීලී චින්තනයෙන් බලසම්පන්න කිරීම

(1) A, B නිවැරදි ය.
(2) A, C නිවැරදි ය.
(3) A, B, D නිවැරදි ය.
(4) B, C, D නිවැරදි ය.
(5) A, B, C, D සියල්ල නිවැරදි ය.

8. කතාබහ, හැසිරීම් රටා, උපකරණ භාවිතය, හැඩගැන්වීම්, ඇඳුම් පැළඳුම් භාවිතයෙන් ප්‍රබල ලෙස අදහස් සම්ප්‍රේෂණය කළ හැකි සන්නිවේදන ස්වරූපය වන්නේ,

(1) රූපණය යි. (2) දෘශ්‍ය සන්නිවේදනය යි. (3) නිර්වාචික සන්නිවේදනය යි.

(4) කථන සන්නිවේදනය යි. (5) වාචික සන්නිවේදනය යි.

9. සචිනි දූන්වීම්කරණ ආයතනයක විද්‍යුත් ලිපිනයට සිය ජීවදත්ත පත්‍රිකාව යැවූ අතර එසැණින් ඇගේ විද්‍යුත් ලිපිනයට පිළිතුරක් ලැබුණි. මෙය නව මාධ්‍යයේ දක්නට ලැබෙන,

(1) අධිපාඨනීයත්ය යි. (2) ස්වයංකරණය යි. (3) අන්තර්ක්‍රියාකාරීත්වය යි.

(4) ජාලගතකරණය යි. (5) වේගවත් සන්දේශකරණය යි.

10. "අදෘශ්‍යමානව වෙසෙන පිරිසකට කිසියම් මාධ්‍යකින් අමතන්නේ නම් එය ජනමාධ්‍ය" ලෙස සඳහන්ව ඇත්තේ,

(1) ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ ය.

(2) Many Voice One World කෘතියේ ය.

(3) සුමංගල ශබ්දකෝෂයේ ය.

(4) යුනෙස්කෝ සංවිධාන නිර්වචනයේ ය.

(5) සන්නිවේදන ශබ්දාකරයේ ය.

11. පහත ප්‍රකාශ කියවන්න.

A පුද්ගලයෙකු තුළ ආකල්පමය හෝ චර්යාමය වෙනසක් ඇති වීම
B තොරතුරු සංඥා සංකේත බවට පත් කිරීම
C ග්‍රාහකයා දක්වා සන්දේශය ගමන් කිරීමේ දී පණිවිඩ නිසි ලෙස ගමන් නොකිරීම
D සන්නිවේදන ක්‍රියාවලිය සිදුවන වටපිටාව
E පණිවිඩය අපේක්ෂිත පාර්ශ්වය වෙත රැගෙන යන වාහකය

ඉහත ප්‍රකාශවලින් පැහැදිලිවන සන්නිවේදන මූලිකාංග අනුපිළිවෙළින් දක්වා ඇති වරණය වන්නේ,

(1) සන්දේශය, මාධ්‍ය, බාධක, ආකේතකරණය, සන්දර්භය

(2) බලපෑම, ආකේතකරණය, සන්දර්භය, බාධක, මාධ්‍ය

(3) විකේතකරණය, බාධක, සන්දර්භය, මාධ්‍ය, ආකේතකරණය

(4) බලපෑම, ආකේතකරණය, බාධක, සන්දර්භය, මාධ්‍ය

(5) ප්‍රතිපෝෂණය, විකේතකරණය, මාධ්‍ය, සන්දර්භ, බාධක

12. ප්‍රතිපෝෂණය සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) ප්‍රතිපෝෂණය හේතුවෙන් සන්දේශය විකෘති වේ.

(2) ප්‍රතිපෝෂණය සැම විටම ධනාත්මක මෙන්ම ක්ෂණික වේ.

(3) ග්‍රාහකයා සන්නිවේදකයාට ලබා දෙන ප්‍රතිචාරය ප්‍රතිපෝෂණය වේ.

(4) ප්‍රතිපෝෂණය ලැබීමට ගතවන කාලය අනුව එය ප්‍රමාද විය හැකි ය.

(5) සන්නිවේදන ක්‍රියාවලියේ සාර්ථකත්වයට ප්‍රතිපෝෂණය එතරම් වැදගත් නොවේ.

13. යුරෝපා කොමිසම මගින් ඉදිරිපත් කරන ලද මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ අර්ථකථනයෙහි අඩංගු නොවන කරුණකි,

(1) ඇගයීම (2) පරිහරණය කිරීම (3) විශ්ලේෂණය කිරීම
(4) නිර්මාණය කිරීම (5) ප්‍රවේශ වීම

14. මහජන සම්බන්ධතා පිළිබඳ සංකල්පය වසර 4000ක් කරම් පැරණි ය. ඉරාකයෙන් හමු වූ කීලාක්ෂර සහිත මැටි පුවරුවෙහි සඳහන් වන්නේ,

(1) මහජනතාවට ගම්වර ප්‍රදානය හා රන් රිදී තෑගි කිරීම පිළිබඳ විස්තරයකි.
(2) සේවකයන් හා පාලකයන් අතර ගැටුම් නිරාකරණය පිළිබඳ විස්තරයකි.
(3) ජනතාවට කාව්‍යකරණය හා මතවාද ගොඩනැගීමට ලබා දුන් අවස්ථා පිළිබඳ විස්තරයකි.
(4) සේවක වැඩවර්ජනවල දී පාලකයන් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් සංග්‍රහයකි.
(5) අස්වනු නෙළීම හා වාරි කර්මාන්තය සිදු කර වගා කටයුතු කිරීම පිළිබඳ පාලකයන් මහජනතාව වෙත ලබාදුන් උපදෙස් කිහිපයකි.

15. ගෝලීයකරණයේ නව ප්‍රවණතාවක් ලෙස හඳුනාගත හැකි වන්නේ,

(1) මාධ්‍ය තාක්ෂණය සීමිතව වර්ධනය වීම
(2) බහුජාතික ව්‍යාපාර ඉදිරියට පැමිණීම
(3) සංචාරය හා සංක්‍රමණ සීමා වීම
(4) මානව සම්බන්ධතා හුවමාරු නොවීම
(5) ආත්ම කේන්ද්‍රීය නොවන මාධ්‍ය බිහි වීම

16. තම හිස වෙනත් ශරීරයකට බද්ධ කර අන්තර්ජාලයට මුදා හැර තිබූ ඡායාරූපයක් නිසා අපහසුතාවට පත් සකුණිට ඒ පිළිබඳ ක්ෂණිකව පැමිණිලි කළ හැකි ආයතනය වන්නේ,

(1) පුවත්පත් පැමිණිලි කොමිසමට ය. (2) මානව හිමිකම් කොමිසමට ය.
(3) ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයට ය. (4) පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයට ය.
(5) ශ්‍රී ලංකා විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවට ය.


17. ශාන්තිකර්ම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ප්‍රකාශ අතුරෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) සශ්‍රීකත්වය ප්‍රාර්ථනා කිරීම අපේක්ෂා කෙරේ.
(2) ගොවිතැන් කටයුතු සාර්ථක කර ගැනීමට යොදා ගැනේ.
(3) ගර්භනී කාන්තාවන්ට නිරෝගී දරු සම්පත් ලබා ගැනීම අපේක්ෂා කෙරේ.
(4) බෝවන රෝග හා අපල උපද්‍රවවලින් වැළකීම අපේක්ෂා කෙරේ.
(5) විනෝදාස්වාදය මූලික කොට ගෙන සිදු කෙරේ.

18. රූපවාහිනී නාලිකාවක ප්‍රවෘත්ති ඉදිරිපත් කරන්නා පෙන්වීමට බහුලව යොදා ගනු ලබන රූපරාමුව වන්නේ,

(1) අති සමීප රූපය යි. (2) මධ්‍යම සමීප රූපය යි. (3) මධ්‍යම රූපය යි.
(4) මධ්‍යම දුර රූපය යි. (5) දුර රූපය යි.

* සන්නිවේදන ආකෘතියකට සමාන රූප සටහනක් පහත දැක්වේ. 19 සිට 21 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත රූප සටහන භාවිත කරන්න.




19. .මෙහි 'B' අක්ෂරය මගින් දැක්වෙන්නේ,

(1) ආකේතකරය යි. (2) විකේතකරය යි. (3) අර්ථ නිරූපන යි.
(4) මාධ්‍ය යි. (5) අත්දැකීම් පසුතලය යි.

20. A ලබා දුන් පණිවිඩය පිළිබඳ අපැහැදිලිතා විමසා බැලීමට වැඩි අවස්ථාවක් පවතින්නේ,

(1) D ට ය. (2) C ට ය. (3) B ට ය.
(4) B හා C ට ය. (5) C හා D ට ය.

21. ඉහත 'B' අක්ෂරයට අදාළ ලක්ෂණයක් වන්නේ,

(1) සන්නිවේදක පාර්ශ්වයට විශේෂිත වීම (2) මාධ්‍ය භාවිතයට අදාළ වීම
(3) ග්‍රාහක පාර්ශ්වයට විශේෂිත වීම (4) පුද්ගල අත්දැකීම් අනුව වෙනස් වීම
(5) මාධ්‍යයේ සැකැස්මට උපකාර වීම

22. සිද්ධි කළමනාකරුවෙකුගේ භූමිකාවට අයත් **නොවන** කාර්යයක් වන්නේ,

(1) සැලසුම් කිරීම (2) හදිසි අවස්ථා කළමනාකරණය
(3) කාර්යය සංවිධානය (4) ස්ථානය වෙන් කර ගැනීම
(5) ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම

23. පන්තියක සිසුන් හය දෙනෙකු මාධ්‍ය අධ්‍යයනය විෂයය සඳහා ප්‍රථම වාර පරීක්ෂණයට ලබා ගත් ලකුණු පහත දැක්වේ.

35, 45, 57, 38, 43, 52

ඉහත ලකුණු අනුව මධ්‍යස්ථය හා මධ්‍යන්‍යය පිළිවෙළින් දක්වා ඇති වරණය වන්නේ,

(1) 45 හා 46 ය. (2) 45 හා 42 ය. (3) 44 හා 45 ය.
(4) 44 හා 43 ය. (5) 43 හා 44 ය.

24. සංස්කෘතිය කෙරෙහි මාධ්‍යයේ බලපෑම පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,

(A) සංස්කෘතිය, මාධ්‍ය හා සන්නිවේදනය එකිනෙකින් වෙනස් කළ නොහැකි ප්‍රපංච ත්‍රිත්වයකි.

(B) මාධ්‍ය ජන විඥානය කෙරෙහි බලපෑම් ඇති කරයි.

(C) මාධ්‍ය පුද්ගලයා හා සමාජය වෙත කරන බලපෑම එකිනෙකට වෙනස් වේ.

(D) මාධ්‍ය පුද්ගල පෞරුෂය ගොඩනංවයි.

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) A ,B හා **C** පමණි.

(4) B,C හා D පමණි. (5) A, B,C හා D යන සියල්ල නිවැරදි ය.

25. සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබඳ රෝම සම්මුතිය-2006 හි දැක්වෙන්නේ,

(1) පූර්ණ සමාජ සංවර්ධනය යි.

(2) ''මිනිසුන්ගේ සංවර්ධනය මිස ද්‍රව්‍යමය සංවර්ධනය නොවෙයි'' යන්න යි.

(3) පුළුල් පරාසයක මෙවලම් හා ක්‍රම භාවිත කරමින් සංවාදය මත පදනම් වූ ක්‍රියාවලිය යි.

(4) රටක දුප්පත්කම, අසමානතාව හා විරැකියාව අඩු කිරීම හෝ අහෝසි කිරීම යි.

(5) සමාජ වෙනස්කම් සඳහා ක්‍රියාවලි ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රමයක් යන්න යි.

26. නිර්මාණාත්මක සන්නිවේදනය තුළ රංග කලාව සුවිශේෂ වේ. එහි ප්‍රාසාංගික මූලිකාංගවලට අයත් වන්නේ,

(1) වේෂ නිරූපණය, නිෂ්පාදනය, ඒකපාත්‍ර භාෂණය, ආකෘතිය යි.

(2) ප්‍රස්තුතය, චරිත, විවරණය, භාෂාව යි.

(3) ජවනිකා, ඇඳුම් පැළඳුම්, ශබ්ද, ආලෝකය යි.

(4) මාධ්‍ය ප්‍රභේද, සංගීතය, ප්‍රස්තුතය, චරිත යි.

(5) රංගනය, චරිත අභිප්‍රේරණ, ස්වාස සංයමය, වාග් ව්‍යවහාර යි.

27. නිර්මහාපරිමාණකරණය යන්න **නිවැරදිව** දැක්වෙන්නේ,

(1) පුළුල් ග්‍රාහක ක්ෂේත්‍රයකට ආමන්ත්‍රණය කිරීම යි.

(2) විශාල ග්‍රාහක කණ්ඩායමක් බිහි වීම යි.

(3) මාධ්‍ය තාක්ෂණය යොදා ගෙන පොදු ග්‍රාහක කොටසකට ආමන්ත්‍රණය කිරීම යි.

(4) ග්‍රාහක ක්ෂේත්‍ර වශයෙන් කුඩා කණ්ඩායම්වලට විභේදනය වීම යි.

(5) මුද්‍රිත, ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍යවල පොදු ග්‍රාහක ක්ෂේත්‍රවලට ආමන්ත්‍රණය කිරීම යි.

28. සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ දී අන්තර් සංස්කෘතික අධ්‍යයනය හඳුනාගත යුතු වන්නේ, සංස්කෘති,

(1) හුවමාරු කිරීම ලෙස ය. (2) තුලනය කිරීම ලෙස ය. (3) අනුගමනය කිරීම ලෙස ය.

(4) ගවේෂණය කිරීම ලෙස ය. (5) පරිවර්තනය ලෙස ය.

29. මාධ්‍ය නියාමනය අවශ්‍ය වන්නේ,

(1) රාජ්‍ය මැදිහත් වීමකින් තොරව ස්වාධීන ව මාධ්‍ය පවත්වා ගෙන යාමට ය.

(2) තාක්ෂණික ප්‍රමිතිකරණයට ලක්ව ඇති මාධ්‍ය පිළිබඳ විමසීමට ය.

(3) මාධ්‍ය සේවාවල වෙළෙඳපොළ අධිකාරිය පිළිබඳ සොයා බැලීමට ය.

(4) මාධ්‍ය නියෝජිතයින්ගේ, මාධ්‍යකරුවන්ගේ සුවිශේෂ මැදිහත්වීම් පාලනයට ය.

(5) පාලනයට ලක් නොවූ මහජන සන්නිවේදන ක්‍රම මගින් තනි පුද්ගලයන්ගේ අයිතින්වලට සිදුවන බලපෑම පාලනයට ය.

30. ව්‍යාපාර මහජන සම්බන්ධතාවල දී භාවිත කළ හැකි මහජන සම්බන්ධතා උපක්‍රම අතරට අයත් **නොවන්නේ**,

(1) විශේෂ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම (2) වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්වීම (3) අනුග්‍රාහකත්වය ලබා දීම

(4) දිරි දීමනා ලබා දීම (5) වෙළෙඳ වට්ටම් ලබා දීම

31. පහත ප්‍රකාශ කියවන්න.

A නිශ්චිත කාල වකවානුවක අඛණ්ඩව ප්‍රකාශයට පත්කරන බඳින ලද ප්‍රකාශනයකි.

B ලියූ හෝ මුද්‍රිත හෝ අමුද්‍රිත හෝ කොළ එකට එක් කොට තනා ගත් ලේඛන මිටියකි.

C අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන එකට නොබඳින ලද ප්‍රකාශනයකි.

ABC අනුපිළිවෙළට ඉහත පාඨයන්ට ගැළපෙන පිළිතුර තෝරන්න.

(1) සඟරා, පොත්, පුවත්පත් (2) පොත්, සඟරා, පුවත්පත්

(3) පුවත්පත්, සඟරා, පොත් (4) පොත්, පුවත්පත්, සඟරා

(5) සඟරා, පුවත්පත්, පොත්

32. මාධ්‍ය සන්දේශ විශ්ලේෂණයේ දී පුද්ගලයා පෙළඹවීමට ලක්වන ප්‍රධාන මාන තුන ඇතුළත් වරණය තෝරන්න.

(1) ආකල්ප වෙනස් කිරීම, කුසලතා ගොඩනැගීම, චර්යා වෙනස් කිරීම

(2) කාලයත් සමග වෙනස් කිරීම, ආකල්ප වෙනස් කිරීම, චර්යා වෙනස් කිරීම

(3) කුසලතා ගොඩනැගීම, නව හැකියා ගොඩනැගීම, ආකල්ප වෙනස් කිරීම

(4) හැසිරීම් වෙනස් කිරීම, ආකල්ප වෙනස් කිරීම, චර්යා වෙනස් කිරීම

(5) හැසිරීම් වෙනස් කිරීම, ආකල්ප වෙනස් කිරීම, කාලයත් සමඟ වෙනස් කිරීම

33. ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ සිසුන් අතර ඇති වූ සංවාදයකින් මතු වූ අදහස් පහත දැක්වේ.

කසුන් : ජනප්‍රිය සංස්කෘතිය වෙළෙඳ ව්‍යාපාරයක් බවට පත්වෙලා

රාණි : ගුණාත්මක භාවයෙන් උසස් නිර්මාණ බහුල ව බිහි වෙනවා

ජයා : සුලභව දකින්න පුළුවන්

ඉසාද් : බොහොම සරල දේවල් තමයි අන්තර්ගත වෙලා තියෙන්නේ

මේවා අතරින් නිවැරදි අදහස් ඉදිරිපත් කරනුයේ,

(1) කසුන්, රාණි, සහ ඉසාද් ය. (2) රාණි, ජයා සහ ඉසාද් ය. (3) කසුන්, ජයා සහ ඉසාද් ය.

(4) රාණි, කසුන් සහ ඉසාද් ය. (5) සියල්ලෝම ය.

34. සංවර්ධනය සඳහා සන්නිවේදනයේ ප්‍රායෝගිකභාවය පිළිබඳ අදහස් ඉදිරිපත් කළේ,

(1) ශ්‍රී නිවාස් මෙල්කොට් (2) සිල්වියෝ වයිස්බෝඩ් (3) මහත්මා ගාන්ධි

(4) එඩ්ගා ඕවන්ස් (5) ස්වීඩනයේ මැල්මෝ විශ්වවිද්‍යාලය

35. දූන්වීම්කරණය හා මහජන සම්බන්ධතා යන දෙකටම පොදු සාධකයක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) අනුග්‍රාහකත්වය අවශ්‍ය වීම

(2) පුද්ගලාන්තර සම්බන්ධතා භාවිත නොකිරීම

(3) යන්ත්‍ර සහායක සන්නිවේදන ක්‍රමෝපාය භාවිතය

(4) පෙළඹවීම සඳහා ජනමාධ්‍ය භාවිත කිරීම

(5) මහජන සම්බන්ධතා හා දූන්වීම්කරණය, අළෙවිකරණ කාර්යයක් වීම

36. ජනමාධ්‍ය සන්දේශ අවබෝධකර ගැනිමට, පිළිගැනීමට, ප්‍රතික්ෂේප කිරීමට ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලය වැදගත් වේ. HUB ආකෘතියට අනුව ඊට අදාළ මූලිකාංගය වන්නේ,

(1) නියාමනය යි. (2) ක්ෂේත යි. (3) සන්නිවේදකයා යි.

(4) පෙරහනු යි. (5) දොරටුපාලකයා යි.

37. මාධ්‍ය ක්‍රියාවලිය හඳුනාගැනීම, සන්දේශවල බලපෑම, සන්දේශ විශ්ලේෂණය, සංජානනය, ඇගයීම හා ඒ පිළිබඳ කතිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ කාර්යයන් හැඳින්වීමට යොදා ගත හැකි සංකල්පයකි.

(1) මාධ්‍ය විචාරය (2) අන්තර් අවබෝධය (3) මාධ්‍ය සාක්ෂරතාව

(4) විවරණය (5) සංජානනය

38. මාධ්‍ය විචාරයේ මනෝ විශ්ලේෂණවාදී දෘෂ්ටිකෝණයට අනුව **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) චිත්තවේගී බලපෑම් අවම කරගත හැකි ය.

(2) සැඟවුණු චිත්තවේගවලට ආමන්ත්‍රණය කළ හැකි ය.

(3) සිතුවිලි හා හැඟීම් මගින් ආතතිය ඇතිවන බව හඳුනාගත හැකිය.

(4) මාධ්‍ය ඇසුරෙන් පුද්ගල සම්බන්ධතා ගොඩනැගෙන අයුරු හඳුනාගත හැකි ය.

(5) මාධ්‍ය ක්‍රියාකාරීත්වය හේතුවෙන් මනඃකල්පිත ජීවිතවලට පොළඹවන අයුරු හෙළි කරගත හැකි ය.

39. සක්‍රීය ග්‍රාහකයන් ලෙස විරෝධාකල්ප ප්‍රචලිත කිරීමේ අවකාශයත්, අන්තර්ගතය අවශ්‍ය පරිදි සංස්කරණය හා නිර්මාණයටත් වැඩි ඉඩකඩක් ඇත්තේ,

(1) ජනමාධ්‍ය පරිශීලකයාට ය. (2) ශ්‍රව්‍ය මාධ්‍ය පරිශීලකයාට ය.

(3) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය පරිශීලකයාට ය. (4) මුද්‍රිත මාධ්‍ය පරිශීලකයාට ය.

(5) සමාජ මාධ්‍ය පරිශීලකයාට ය.

40. මහජන සම්බන්ධතාව යන්න නිවැරදිව අර්ථ ගැන්වෙන ප්‍රකාශය වන්නේ, එය

(1) ආයතනයක මූලික අළෙවිකරණ කාර්යය හා සම්බන්ධ වේ.

(2) ආයතනයක අරමුණු ඵලදායී හා විධිමත්ව අත්පත් කර ගැනීමට යොදා ගනී.

(3) ආයතනයක අනුග්‍රාහකත්වය හා ප්‍රචාරණය ලබා ගැනීම හා සම්බන්ධ වේ.

(4) ආයතනයක අවශ්‍යතා වෙනුවෙන් ජන මාධ්‍ය භාවිතයට යොදා ගැනීම හා සම්බන්ධ වේ.

(5) ආයතනයකට සුබ පතන්නන්, ආයෝජකයින්ගේ ප්‍රචාරණ උපක්‍රම දිරිමත් කිරීම හා සම්බන්ධ වේ.

41. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමට ඒකාබද්ධ ආයතන ඇතුළත් වරණය වන්නේ,

(1) පරිගණක නියාමන ආයතනය, තොරතුරු තාක්ෂණ ආයතනය, විදුලි සන්දේශ නියාමන කොමිසම යි.

(2) පුවත්පත් නියෝජිත ආයතනය, කලා සංසදය, තොරතුරු තාක්ෂණ ආයතනය යි.

(3) ශ්‍රී ලංකා කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, පුවත්පත් ප්‍රකාශකයන්ගේ සංගමය යි.

(4) ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය, පුවත්පත් නියෝජිත ආයතනය, විදුලි සන්දේශ නියාමන කොමිසම යි.

(5) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය, කර්තෘ සංසදය, තොරතුරු තාක්ෂණ ආයතනය යි.

42. එක්සත් ජාතීන්ගේ සංවිධානය අන්තර් සම්බන්ධිත සංවර්ධනය සඳහා සන්නිවේදන ප්‍රවේශ ලෙස දක්වන්නේ,

A පාරිසරික සමතුලිතභාවය සඳහා සන්නිවේදනය

B නියාමනය සඳහා සන්නිවේදනය

C හැසිරීම් වෙනස්කම් සඳහා සන්නිවේදනය

D තිරසර සංවර්ධනය සඳහා සන්නිවේදනය

E සමාජයීය වෙනස්කම් සඳහා සන්නිවේදනය

(1) ABCD ය. (2) ABDEය.
(3) ACDEය. (4) BCDEය.
(5) ABCE ය.

43. පහත වගුවේ දක්වා ඇති ජනමාධ්‍යයේ කාර්යභාරය ABCD ප්‍රකාශ සමග නිවැරදිව ගළපන්න.

| | |
|---|---|
| 1. සුපරීක්ෂණය | A සංස්කෘතිය පවරාදීම |
| 2. අර්ථකථනය | B සමාජ ස්ථායීතාව පවත්වාගැනීම |
| 3. සහසම්බන්ධය | C පරිසරය පිළිබඳ අවදියෙන් කටයුතු කිරීම |
| 4. සමාජානුයෝජනය | D තොරතුරු විශ්ලේෂණය කිරීම |

(1)1C 2D 3B 4A (2)1D 2C 3B 4A (3)1C 2D 3A 4B

(4)1A 2D 3B 4C (5) 1C 2B 3D 4A

44. චිත්‍රපට ශාලා සඳහා චිත්‍රපට මුදාහැරීමේ දී නිකුත් කරනු ලබන සහතිකයේ U, X, A වර්ගීකරණයේ X සහතිකය මගින් දක්වන අදහස ඇතුළත් වරණය වන්නේ,

(1) වැඩිහිටියන්ට වඩාත් සුදුසු ය.

(2) අසීමාන්තික මහජන ප්‍රදර්ශනයට සුදුසු ය.

(3) වැඩිහිටියන්ට පමණක් සුදුසු ය.

(4) කිසිම බාධාවකින් තොරව සෑම කෙනෙකුටම නැරඹිය හැකි ය.

(5) වැඩිහිටියන් සමග පැමිණෙන වයස අවුරුදු 18 ට අඩු ළමයින්ට ද නැරඹිය හැකි ය.

45. රටක සංවර්ධනය ක්‍රියාත්මක විය හැකි ආකාරය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A ඉහළ සිට පහළට ක්‍රියාත්මක වේ.

B ද්විමාර්ගික සන්නිවේදන පද්ධති ක්‍රියාත්මක වේ.

C සංවාදය මත පදනම් වූ සමාජ ක්‍රියාවලියක් වේ.

D සමානාත්මතාව මත පදනම් වූ ස්ථිර සාර ක්‍රියාවලියකි.

E ධනේශ්වර සාරධර්ම ව්‍යාප්තිය මගින් ක්‍රියාත්මක වේ.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් සංවර්ධනය සඳහා සන්නිවේදනයට වඩාත් සමීප ප්‍රකාශන වන්නේ,

(1) B C හා D ය. (2) A B හා C ය. (3) A B හා E ය.

(4) B C හා E ය. (5) A C හා E ය.

46. සිද්ධි කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම අතර අවම වැදගත්කමක් දක්වන්නේ,

(1) කාල කළමනාකරණය කිරීම

(2) මූල්‍ය කළමනාකරණය කිරීම

(3) මාධ්‍ය මගින් ප්‍රවර්ධනය කිරීම

(4) අර්බුදකාරී තත්ත්ව කළමනාකරණය කිරීම

(5) මාධ්‍ය හා සමීප සබඳතා ගොඩනැගීම

47. සාම්ප්‍රදායික මාධ්‍ය පිළිබඳ සිසුන් දැක්වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.

ගැමි ජන ජීවන රටා උද්දීපනය කරයි.

අධ්‍යාපනික කාර්යය සඳහා යොදා ගනියි.

සමාජ අවබෝධය ඇති කිරීමට මූලික වශයෙන් යොදා ගනියි.

ඉහත ප්‍රකාශ සමග වඩාත් ගැළපෙන සාම්ප්‍රදායික මාධ්‍ය විධික්‍රම වන්නේ,

(1) ජනකතා, තේරවිලි, ශාන්තිකර්ම

(2) ශාන්තිකර්ම, යාතුකර්ම, ජනකතා

(3) ජනකවි, ජනකතා, ගැමි නාටක

(4) තේරවිලි, ප්‍රස්තාව පිරුළු, ශාන්තිකර්ම

(5) ජනකතා, ජනකවි, තේරවිලි

48. සමීක්ෂණයක් සඳහා ගැටලුවක් තෝරා ගැනීමෙන් පසුව සිදු කළ යුතු ඊළඟ පියවර වන්නේ,

(1) අරමුණ හඳුනා ගැනීම යි.
(2) දත්ත රැස්කර ගැනීම යි.
(3) මාතෘකාව තීරණය කිරීම යි.
(4) ප්‍රශ්නාවලියක් සකස් කර ගැනීම යි.
(5) නිරීක්ෂණය කිරීම යි.

49. බී. මැලිනොව්ස්කිගේ සංස්කෘතිය පිළිබඳ නිර්වචනය තුළ අන්තර්ගත සාධක වන්නේ,

A උපකරණ B පාරිභෝගික ද්‍රව්‍ය C මානව සංකල්පනා D දැනුම E විශ්වාස හා චාරිත්‍ර

(1) ABCD ය.
(2) ABDE ය.
(3) ABCE ය.
(4) ACDE ය.
(5) BCDE ය.

50. මාධ්‍ය සාක්ෂරතාවට අයත් තෙවැදෑරුම් සිද්ධාන්ත නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,

(1) ස්වකේන්ද්‍රය, ඥාන ව්‍යුහ, කුසලතා
(2) ස්වකේන්ද්‍රය, සංජානනය, සහවේදනය
(3) සංජානනය, ස්වපඨය, කුසලතා
(4) ඥාන ව්‍යුහ, ස්වපඨය, සංජානනය
(5) ස්වපඨය, සහවේදනය, ඥාන ව්‍යුහය

***

**අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி அமைச்சு
**Ministry of Education**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv.Level) Examination, 2024

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II
தொடர்பாடலும் ஊடகக் கற்கையும் II
Communication and Media Studies II

**29 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න කියවා තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න**

උපදෙස්:

❖ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව 40 කි.

1. "සන්නිවේදනය අසිරිමත් මානවීය ක්‍රියාවලියකි "

(i) සන්නිවේදනය පිළිබඳ ශැනන් හා වීවර්ගේ නිර්වචනය ලියා දක්වන්න.
(ලකුණු 4)

(ii) සන්නිවේදනයේ ස්වභාවය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.
(ලකුණු 8)

(iii) විවිධ සන්නිවේදන ස්වරූප සම්මිශ්‍රිත ව භාවිත කිරීම ඵලදායී සමූහ සන්නිවේදනයකට හේතු වේ. සන්නිවේදන ස්වරූප තුනක් ඇසුරින් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
(ලකුණු 12)

(iv) පාසල් මාධ්‍ය දින තරගාවලිය සංවිධානය කිරීමේ දී අන්තර්‍ය සන්නිවේදනය යොදා ගත හැකි ආකාර හතරක් උදාහරණ සහිත ව විස්තර කරන්න.
(ලකුණු 16)

2. මාධ්‍ය ඔස්සේ ගලායන අසීමාන්තික තොරතුරු හමුවේ සක්‍රීය ග්‍රාහකයකු වීම අභියෝගයකි.

(i) ජනසන්නිවේදනයේ ප්‍රයෝජන දෙකක් නම් කරන්න
(ලකුණු 4)

(ii) සුහුරු ජංගම දුරකථනයෙන් පුද්ගලාන්තර සන්නිවේදනයේ යෙදෙන අවස්ථාවක දී භාවිත කළ හැකි නිර්වාචික සන්නිවේදන විධික්‍රම දෙකක් නිදසුන් සහිත ව කෙටියෙන් පැහැදිලි කරන්න
(ලකුණු 8)

(iii) වර්තමානයේ සමාජ මාධ්‍ය භාවිතය වඩා විධිමත් විය යුතු බවට මතවාදයක් ගොඩ නැගී ඇත. වගකීමෙන් යුතුව නව මාධ්‍ය පරිහරණය සඳහා ඔබ යෝජනා කරන ආචාර ධර්ම තුනක් විස්තර කරන්න.
(ලකුණු 12)

(iv) මාධ්‍ය සන්දේශයක් විශ්ලේෂණය කිරීමට යොදා ගන්නා පහත සඳහන් කරුණු විස්තර කරන්න.

1. අර්ථය.
2. අදාළ බව.
3. පක්ෂපාතීත්වය.
4. ඇගයීම.

(ලකුණු 16)

3. මානව සම්බන්ධතා හසුරවන ප්‍රබල බලවේගයක් ලෙස මාධ්‍ය ක්‍රියාත්මක වේ.

(i) ප්‍රාදේශීය මාධ්‍ය වාර්තාකරණයේ දී භාවිත කළ හැකි සමාජ මාධ්‍ය යෙදවුම් හතරක් නම් කරන්න.

(ලකුණු 4)

(ii) ප්‍රධාන බාධක වර්ග දෙක පුවත්පත් මාධ්‍ය ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

(iii) සාම්ප්‍රදායික මාධ්‍යයේ වැදගත්කම් තුනක් උදාහරණ සහිත ව විස්තර කරන්න

(ලකුණු 12)

(iv) ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ මාධ්‍ය අභිසාරීතාව හේතුවෙන් සිදු වී ඇති වෙනස්කම් හතරක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 16)

4. මාධ්‍ය සන්දේශ තෝරා බේරා ගෙන පරිහරණය කිරීමට මාධ්‍ය සාක්ෂරතාව අවශ්‍ය වේ.

(i) ඇමරිකානු මාධ්‍ය සාක්ෂරතාව සඳහා වන ජාතික ආයතනය ඉදිරිපත් කළ නිර්වචනයේ අන්තර්ගත මාධ්‍ය සාක්ෂරතා කුසලතා හතරක් නම් කරන්න.

(ලකුණු 4)

(ii) සන්නිවේදන අධ්‍යයනය ක්ෂේත්‍රය පිළිබඳ ව ශාස්ත්‍රීය වශයෙන් අධ්‍යයනය කිරීමේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න

(ලකුණු 8)

(iii) නිර්මාණශීලී කාර්ය සිදු කිරීම සඳහා වැදගත්වන මූලිකාංග තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(iv) මැතිවරණ සමයක දී මාධ්‍යයේ බලපෑම පහත දක්වා ඇති කරුණු ඔස්සේ විග්‍රහ කරන්න.

(අ) ජනමත සැකසීම

(ආ) ප්‍රතිරූප ගොඩනැගීම

(ඇ) මාධ්‍ය හැසිරීම

(ඈ) ප්‍රචණ්ඩත්වය

(ලකුණු 16)

5. (i) මහජන සම්බන්ධතා මෙවලම් දෙකක් හා විධි ක්‍රම දෙකක් නම් කරන්න

(ලකුණු 4)

(ii) මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 8)

(iii) මහජනතාවගේ පොදු සුභ සිද්ධිය සලසාදීම සඳහා මාධ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කරයි.

රටක මාධ්‍ය ප්‍රතිපත්තියක අන්තර්ගත විය යුතු කරුණු තුනක් විස්තර කරන්න.

(ලකුණු 12)

(iv) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය අන්තර්ගතයෙහි දැකිය හැකි නව ප්‍රවණතා හතරක් නිදසුන් සහිත ව

පැහැදිලි කරන්න

(ලකුණු 16)

6. (i) ගුවන්විදුලි මාධ්‍ය භාෂාවේ සුවිශේෂතා හතරක් නම් කරන්න.

(ලකුණු 4)

(ii) ඔබ කැමති ජනමාධ්‍යයක් ඇසුරෙන් සන්නිවේදන මූලිකාංග දෙකක් නිදසුන් සහිත ව විස්තර කරන්න.

(ලකුණු 8)

(iii) ජනශ්‍රැතිකාංග තුනක් නම් කර ඒවා රූපවාහිනී වැඩසටහනක් සම්පාදනයේ දී යොදා ගත හැකි ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(iv) පාසල් නායකත්ව පුහුණු කඳවුරක දී සිද්ධි කළමනාකරණය යොදාගත හැකි අයුරු පහත කරුණු ඔස්සේ පැහැදිලි කරන්න.

(අ) අයවැය තීරණය කිරීම

(ආ) අනුග්‍රාහකත්වය

(ඇ) සෞඛ්‍ය හා ආරක්ෂණ විධි

(ඈ) අවදානම් තක්සේරු කිරීම

(ලකුණු 16)

7. යම් ප්‍රදේශයක රසායනික කර්මාන්ත ශාලාවක් පිහිටුවීමට විරෝධය පාමින් ජනතාව ඒකරාශී වූහ.

(i) ග්‍රාමීය ජනතාව ඒකරාශි කර ගැනීම සඳහා භාවිතයට ගත හැකි මාධ්‍ය විධික්‍රම 4 ක් නම් කරන්න.

(ලකුණු 4)

(ii) ජනතාවගේ විරෝධයට හේතු සෙවීමට සමීක්ෂණයක් සිදු කරන්නේ නම් එහි ඇති වාසි දෙකක් විස්තර කරන්න.

(ලකුණු 8)

(iii) සමීක්ෂණයක දී දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලියක් සකස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් විස්තර කරන්න.

(ලකුණු 12)

(iv) ඉහත ගැටලුවට විසදුම් සෙවීමේ දී සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂා යොදා ගත හැකි ආකාරය පහත මාතෘකා යටතේ නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(අ) සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය

(ආ) යහපත් පරිසරයක් ගොඩනැගීම

(ලකුණු 16)

***

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2024

29 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

ලකුණු බෙදී යාම

I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | **3** | 11. | **4** | 21. | **4** | 31. | **1** | 41. | **3** |
| 02. | **2** | 12. | **4** | 22. | **5** | 32. | **5** | 42. | **5** |
| 03. | **1** | 13. | **5** | 23. | **3** | 33. | **3** | 43. | **1** |
| 04. | **2** | 14. | **5** | 24. | **5** | 34. | **2** | 44. | **3** |
| 05. | **2** | 15. | **2** | 25. | **3** | 35. | **4** | 45. | **1** |
| 06. | **5** | 16. | **4** | 26. | **5** | 36. | **4** | 46. | **5** |
| 07. | **5** | 17. | **5** | 27. | **4** | 37. | **3** | 47. | **3** |
| 08. | **1** | 18. | **2** | 28. | **2** | 38. | **4** | 48. | **1** |
| 09. | **2** | 19. | **3** | 29. | **5** | 39. | **5** | 49. | **3** |
| 10. | **1** | 20. | **2** | 30. | **4** | 40. | **2** | 50. | **1** |

අ.පො.ස උසස් පෙළ 2024

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

II පත්‍රය

පිළිතුරු

1. "සන්නිවේදනය අසිරිමත් මානවීය ක්‍රියාවලියකි "

(i) සන්නිවේදනය පිළිබඳ ශැනන් හා වීවර්ගේ නිර්වචනය ලියා දක්වන්න.

''සන්නිවේදනය යනු යම් තැනක දී නිර්මාණය කර ගත් හෝ තෝරාගත් පණිවිඩයක් ඒ ආකාරයෙන් ම හෝ ඊට සමාන ලෙස වෙනත් තැනක දී ප්‍රතිනිර්මාණය කිරීම යි.''

Source: Shannon & Weaver, W. The Mathematical Theory of Communication. Urbana, IL: University of Illinois Press,1949

(ලකුණු 4)

(ii) සන්නිවේදනයේ ස්වභාවය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

- සන්නිවේදනය අරමුණු සහගත ය.
- සන්නිවේදනය සංකේතාත්මක ය.
- සන්නිවේදනය සන්දර්භානුගත ය.
- සන්නවේදනය ක්‍රියාපටිපාටියකි.
- සන්නිවේදනය විවිධාකාර වේ.
- සන්නිවේදනය ඒක මාර්ගික මෙන්ම ද්වි මාර්ගික වේ.
- සන්නිවේදනය බලය වේ.

(ලකුණු 8)

(iii) විවිධ සන්නිවේදන ස්වරූප සම්මිශ්‍රිත ව භාවිත කිරීම ඵලදායී සමූහ සන්නිවේදනයකට හේතු වේ. සන්නිවේදන ස්වරූප තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

- වාචික සන්නිවේදනය
- නිර්වාචික සන්නිවේදනය
- කථන සන්නිවේදනය
- රූපණය/ප්‍රාසාංගික
- ලිඛිත සන්නිවේදනය
- ශ්‍රව්‍ය සන්නිවේදනය
- දෘශ්‍ය සන්නිවේදනය
- විධිමත් සන්නිවේදනය
- අවිධිමත් සන්නිවේදනය

සමූහ සන්නිවේදන අවස්ථාවක දී ඉහත සන්නිවේදන ස්වරූප අවස්ථානුකූලව යොදා ගැනීම උදාහරණ සහිතව පැහැදිලි කළ යුතු ය. (ලකුණු 12)

(iv) පාසල් මාධ්‍ය දින තරගාවලිය සංවිධානය කිරීමේ දී අතථ්‍ය සන්නිවේදනය යොදා ගත හැකි ආකාර හතරක් උදාහරණ සහිත ව විස්තර කරන්න.

1. මාධ්‍ය දින තරගාවලියට විශේෂිත වූ වෙබ් අඩවියක් නිර්මාණය කිරීම
2. මාධ්‍ය දින තරගාවලියට විශේෂිත වූ Face book/ Whatsapp ගිණුම් නිර්මාණය කිරීම
3. මාර්ගගතව අදාළ පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගත හැකි වීම (උදා - Zoom/ Google Team/ Conference Call)
4. Google Form භාවිතයෙන් අයදුම්කරුවන්ගේ විස්තර ලබා ගැනීම
5. නිර්මාණ උඩුගත කළ හැකි වෙබ් අඩවි, විද්‍යුත් ලිපින ලබා දීම
6. තරගාවලියේ නිර්මාණ වෙබ් අඩවියට හා WhatsApp සමූහයට උඩුගත කර ගැනීම
7. ශ්‍රව්‍ය-දෘශ්‍ය දැන්වීම් යූ ටියුබ්/මුහුණු පොත හරහා පල කිරීම
8. සමාජ මාධ්‍ය තොරතුරු බෙදා හැරීම/ දැන්වීම් පළ කිරීම/ මුහුණු පොතේ පෝස්ට් පල කිරීම
9. පොඩ් කාස්ට් මගින් දැනුවත් කිරීම

ඉහත කියාකාරකම් සඳහා යොමු වීම උදාහරණ සහිතව පැහැදිලි කළ යුතු ය.

2. මාධ්‍ය ඔස්සේ ගලායන අසීමාන්තික තොරතුරු හමුවේ සක්‍රිය ග්‍රාහකයකු වීම අභියෝගයකි.

(i) ජනසන්නිවේදනයේ ප්‍රයෝජන දෙකක් නම් කරන්න.

(ලකුණු 16)

1. ප්‍රජානනය
2. නිශ්කර්ෂණය
3. සමාජ උපයෝගීතාව
4. අපසරණය

(ii) සුහුරු ජංගම දුරකථනයෙන් පුද්ගලාන්තර සන්නිවේදනයේ යෙදෙන අවස්ථාවක දී භාවිත කළ හැකි නිර්වාචික සන්නිවේදන විධික්‍රම දෙකක් නිදසුන් සහිත ව කෙටියෙන් පැහැදිලි කරන්න

1. මුහුණේ භාව ප්‍රකාශන
2. හස්ත සංඥා
3. ශාරීරික ඉරියව්
4. විවිධ සංඥා සංකේත/ ඉමෝජි/ ස්ටිකර්/ ග්‍රානික/ ඡායාරූප
5. හඬෙහි උස් පහත් බව, රිද්මය, වේගය
6. නිශ්ශබ්දතාව

(iii) වර්තමානයේ සමාජ මාධ්‍ය භාවිතය වඩා විධිමත් විය යුතු බවට මතවාදයක් ගොඩ නැගී ඇත. වගකීමෙන් යුතුව නව මාධ්‍ය පරිහරණය සඳහා ඔබ යෝජනා කරන ආචාර ධර්ම තුනක් විස්තර කරන්න.

- වැරදි හා අසත්‍ය තොරතුරු අන්තර්ජාලයට එක් කිරීමෙන් වැළකීම
- අන් අයගේ පෞද්ගලිකත්වයට හානි නොවන අයුරින් නව මාධ්‍ය පරිශීලනය
- වංචනික කටයුතු සඳහා නව මාධ්‍ය යොදා නොගැනීම
- අනවසර මෘදුකාංග භාවිතයෙන් වැළකීම
- අන් අයගේ නිර්මාණ, කෘති අනවසරයෙන් මුදල් ඉපයීම සඳහා භාවිත නොකිරීම
- ව්‍යාජ ගිණුම් සකස් කිරීමෙන් වැළකීම
- අන්අයගේ ගිණුම්වලට අනවසරයෙන් ඇතුළුවීමෙන් වැළකීම

(iv) මාධ්‍ය සන්දේශයක් විශ්ලේෂණය කිරීමට යොදා ගන්නා පහත සඳහන් කරුණු විස්තර කරන්න.

1. අර්ථය
2. අදාළ බව
3. පක්ෂපාතීත්වය
4. ඇගයීම

1. අර්ථය – ඍජුව ප්‍රකාශිත නොවන යමක් පිළිබඳව පැහැදිලිව සන්නිවේදනය කිරීම (සන්දේශය මගින් අදහස් කරන, ප්‍රකාශිත හෝ ඇඟවුම් කරන දේ) උඩු පෙළ හා යටි පෙළ මගින් අර්ථය ගොඩනැගේ.

2. අදාළ බව - සන්දේශයට අදාළ අන්තර්ගතය උචිත පරිදි ගැළපීම (අඛ්‍යානය, අනුක්‍රමය, සමබරතාව, සුසංයෝගය, ප්‍රමාණාත්මක බව, උචිත තාක්ෂණය)

3. පක්ෂපාතීත්වය – පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට විශේෂත්වයක් දැක්වීම, සාධාරණ හේතු හෝ ප්‍රමාණවත් දැනුමක් නොමැතිව නිගමනවලට එළඹීම හෝ යම් අදහස් මත පදනම් වූ මතයක් දැරීමයි.

   උදා – ප්‍රවෘත්ති
   - මූලාශ්‍රය තෝරා ගැනීම
   - මූලාශ්‍රය ගොඩ නගන දිශානතිය
   - සම්මුඛ සාකච්ඡා සඳහා පුද්ගලයින් තෝරා ගන්නා ආකාරය
   - යොදා ගනු ලබන ඡායාරූප, වීඩියෝ
   - සංස්කරණ ක්‍රම

   ආදිය මත පක්ෂග්‍රාහී ප්‍රවෘත්ති තෝරා ගැනීම

4. ඇගයීම – සන්දේශයක අන්තර්ගතය තක්සේරු කිරීම. ඒ සඳහා යොදාගන්නා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයා ගනිමින් සන්දේශයේ ස්වභාවය අවබෝධ කරගත හැකිය.

සන්දේශය කුමක්ද?

ඉදිරිපත් කරන්නේ කවුද?

සන්දේශයේ අන්තර්ගතය කුමක්ද?

අන්තර්ගතය ඉදිරිපත් කරන්නේ කුමන හේතුවක් නිසාද?

ආදිය ප්‍රශ්න විමසමින් සන්දේශයේ අන්තර්ගතය තක්සේරු කිරීම.

3. මානව සම්බන්ධතා හසුරවන ප්‍රබල බලවේගයක් ලෙස මාධ්‍ය ක්‍රියාත්මක වේ.

(i) ප්‍රාදේශීය මාධ්‍ය වාර්තාකරණයේ දී භාවිත කළ හැකි සමාජ මාධ්‍ය යෙදවුම් 4ක් නම් කරන්න.

- Facebook
- Twitter
- You tube
- WhatsApp
- Viber වැනි

(ii) ප්‍රධාන බාධක වර්ග දෙක පුවත්පත් මාධ්‍ය ඇසුරෙන් පැහැදිලි කරන්න.

අර්ථ බාධක මාධ්‍ය බාධක

- මාධ්‍ය බාධක/නාලිකාව හා සම්බන්ධ බාධක - නාලිකාවේ හෙවත් මාධ්‍යයේ ඇති වන දෝෂ සහගත තත්ත්ව නිසා ඇති වේ.
  මුද්‍රිත මාධ්‍ය තුළ මාධ්‍ය බාධා - තීන්ත බොඳ වීම එක පිට එක මුද්‍රණය වීම තීන්ත විසිරීම නිසා කියවීමට දුෂ්කර වීම/ ඡායාරූප අපහැදිලි වීම
- අර්ථ බාධක - සන්දේශයේ අර්ථය හරි හැටි ග්‍රහණය කර ගැනීමට නොහැකි වන විට උද්ගත වේ. ( සන්දේශයක් නොතේරීම හෝ තේරුම් ගැනීමට නොහැකි වීම)
  මුද්‍රිත මාධ්‍ය තුළ අර්ථ බාධා - විරාම ලකුණු / පද බෙදීම ආදිය නිවැරදිව නොයෙදීම/ අක්ෂර වින්‍යාස දෝෂ/ ව්‍යාකරණානුකූල නොවීම/ උපභාෂා භාවිතය/ ප්‍රාදේශීය භාෂා භාවිතය/ භාෂාව අපැහැදිලි වීම/ විදග්ධ භාෂා භාවිතය/ පාරිභාෂික හෝ තාක්ෂණික වචන යොදා ගැනීම/ පෙළ සහ රූප එකිනෙකට නොගැළපීම

(iii) සාම්ප්‍රදායික මාධ්‍යයේ වැදගත්කම් තුනක් උදාහරණ සහිත ව විස්තර කරන්න

- **දැනුම් ඉගෙනුම් සම්පාදනය**

  වැඩිහිටි පරම්පරාවෙන් බාල පරම්පරාවට අවශ්‍ය දැනුම ලබා දීම
- **උපදේශාත්මක සන්දේශ ජනනය කළ හැකි වීම**

ආගමික, සාරධර්ම, සංස්කෘතික වටිනාකම් ඇතුළු සෞඛ්‍ය, අධ්‍යාපනය, විවිධ ජීවන අත්දැකීම් හුවමාරු කිරීම සඳහා භාවිත කිරීම

- **සංස්කෘතික අංග හුවමාරු කිරීමට හැකි වීම**

  ඇදහිලි, විශ්වාස, චාරිත්‍ර වාරිත්‍ර, කලාව, දැනුම, නීති රීති, සිරිත් විරිත් යනාදිය සාම්ප්‍රදායික මාධ්‍ය ඔස්සේ පරම්පරාවෙන් පරම්පරාවට හුවමාරු කිරීම

- **භාව ප්‍රකාශනය**

  සිතෙහි ගොඩනැගුණු දුක් දොම්නස්, සතුට යනාදි මනෝභාවයන් ප්‍රකාශනයේ දී තොරතුරු හුවමාරු කිරීමට භාවිත කරන විධි ක්‍රමයක් ලෙස සම්ප්‍රදයික මාධ්‍ය උපයෝගී කර ගැනීම

- **අහිතකර සමාජ ප්‍රවණතා විවේචනයට ලක් කිරීම**

  සමාජයේ යම් අහිතකර සිද්ධි, චරිත විවේචනය කරමින් හාස්‍ය උපහාසය මුසු කරමින් ගැමි ජනතාව දැනුවත් කිරීම

  උදාහරණ ලෙස පොලිස් කෝලම, ආරච්චි කෝලම දැක්විය හැකි ය.

- **විනෝදාස්වාදය සඳහා යොදා ගත හැකි වීම**

  ගැමි ජනතාව තම විනෝදය සඳහා සාම්ප්‍රදායික මාධ්‍ය උපයෝගී කර ගැනීම (අස්වනු නෙළීමත් සමග තම කාන්සිය, මහන්සිය නිවා ගැනීම සඳහා සාම්ප්‍රදායික සන්නිවේදනයන් භාවිත කිරීම)

(iv) ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ මාධ්‍ය අභිසාරීතාව හේතුවෙන් සිදු වී ඇති වෙනස්කම් හතරක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

1. විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය අන්තර්ජාලය පදනම් ව එක් වේදිකාවක් මත ක්‍රියාත්මක වීම
2. බහුමාධ්‍ය පරිශීලනය
3. ග්‍රාහක අභිමතය පරිදි මාධ්‍ය වැඩසටහන් පරිශීලනය කිරීමට හැකි වීම
4. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සුහුරු ජංගම දුරකථනයෙන් පරිශීලනය කිරීම
5. පුළුල් ග්‍රාහක ක්ෂේත්‍රයක් ආවරණය වීම.
6. මාධ්‍යකරුවන්ගේ හා ග්‍රාහකයන්ගේ භූමිකා වෙනස් වීම හා පුළුල් වීම (තොරතුරු උඩුගත කිරීම/ බාගත කිරීම)
7. සංදේශ වේගවත්ව ව්‍යාප්ත වීම
8. පුළුල් ග්‍රාහක ස්වභාවයට අනුව ජනමාධ්‍ය අන්තර්ගතය තීරණය කිරීම

:

උදා - භෞතිකව දුර සිටින මාධ්‍යවේදියෙකුට එසැනින් රූ ගත කළ දර්ශන අන්තර්ජාලය ඔස්සේ අදාළ මාධ්‍ය ආයතනය වෙත උඩුගත කළ හැක.

ජනමාධ්‍යයේ ප්‍රමාදී ප්‍රතිපෝෂණ වෙනුවට එසැනින් comments, Share, Likes ලෙස ප්‍රතිචාර ලබා ගත හැක

ජනමාධ්‍යයට අමතරව යූ ටියුබ් චැනල් හරහා වැඩසටහන් ප්‍රවර්ධනය කළ හැක

Peo TV හරහා වැඩසටහන් නැවත නැරඹිය හැකි ය

යූ ටියුබ් හරහා නැවත නැවත ජනමාධ්‍යයේ විකාශිත වැඩසටහන් නැරඹිය හැකි ය

මුද්‍රිත පුවත්පතෙහි PDF E Version ලෙස කියවිය හැකි ය.

මුද්‍රිත පුවත්පතෙහි E Version වේගවත්ව යාවත්කාලීන කළ හැකි වීම

ජනමාධ්‍ය ආයතනවලට අදාළ වෙබ් අඩවිවල ගබඩා කොට ඇති සංදේශ පරිශීලනය කළ හැකි වීම

4. මාධ්‍ය සන්දේශ තෝරා බේරා ගෙන පරිහරණය කිරීමට මාධ්‍ය සාක්ෂරතාව අවශ්‍ය වේ.

(i) ඇමරිකානු මාධ්‍ය සාක්ෂරතාව සඳහා වන සඳහා වන ජාතික ආයතනය ඉදිරිපත් කළ නිර්වචනයෙහි අන්තර්ගත මාධ්‍ය සාක්ෂරතා කුසලතා හතරක් නම් කරන්න.

1. මාධ්‍යයන්ට ප්‍රවේශ වීම
2. මාධ්‍ය විශ්ලේෂණය
3. මාධ්‍ය ඇගයීම
4. මාධ්‍ය නිර්මාණය
5. මාධ්‍ය තුළ ක්‍රියාශීලිව කටයුතු කිරීමේ සමත් බව

(ii) සන්නිවේදන අධ්‍යයනය ක්ෂේත්‍රය පිළිබඳ ව ශාස්ත්‍රීය වශයෙන් අධ්‍යයනය කිරීමේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න

1. ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් සන්නිවේදන ක්‍රියාදාමය හා මාධ්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධය
2. විචාරශීලී ව මාධ්‍ය පරිහරණය කිරීමේ කුසලතා වර්ධනය
3. අවශ්‍ය, අදාළ තොරතුරු තෝරා ගැනීම
4. ගවේෂණශීලී භාවය වර්ධනය
5. විචාරශීලි චින්තනය දියුණු වීම
6. මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය
7. යහපත්, ආචාරශීලී හා ඵලදායී මානව අන්තර් සම්බන්ධතා සඳහා යොමු වීම
8. සමාජ ප්‍රගමණය සඳහා සක්‍රිය දායකත්වය ලබාදීම
9. නිර්මාණාත්මක චින්තනය වැඩිදියුණු වීම
10. ඵලදායී මාධ්‍ය සන්දේශ නිර්මාණය
11. සංවර්ධනාත්මක හා ප්‍රජාතන්ත්‍රවාදි චින්තනයෙන් පෝෂණය වූ පුරවැසියෙකු වීමට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා හා පුරුදු
12. ජන මාධ්‍ය ආයතනයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධය

(iii) නිර්මාණශීලී කාර්ය සිදු කිරීම සඳහා වැදගත් වන මූලිකාංග තුනක් පැහැදිලි කරන්න

1. නිර්මාණ ශිල්පියා
2. නිර්මාණාත්මක චින්තනය
3. නිර්මාණාත්මක රචනය
4. නිර්මාණය/නිර්මාණශීලීත්වය

(iv) මැතිවරණ සමයක දී මාධ්‍යයේ බලපෑම පහත දක්වා ඇති කරුණු ඔස්සේ විග්‍රහ කරන්න.

(අ) ජනමත සැකසීම
(ආ) ප්‍රතිරූප ගොඩනැගීම
(ඇ) මාධ්‍ය හැසිරීම
(ඈ) ප්‍රචණ්ඩත්වය

**ජනමත සැකසීම -** මාධ්‍ය විසින් බහුතර ජනතාවකගේ අදහස් එක් අරමුණකට ගොනු කිරීම සඳහා ක්‍රියාත්මක වීම උදාහරණ සහිතව පැහැදිලි කළ යුතු ය.

**ප්‍රතිරූප ගොඩනැගීම** - මාධ්‍ය විසින් අපේක්ෂකයෙකුගේ වර්තමාන තත්ත්වය පිළිබඳ අවබෝධයෙන් අපේක්ෂිත ඉලක්කය ජයගැනීමට අවශ්‍ය පසුබිම සැකසීම උදාහරණ සහිතව පැහැදිලි කළ යුතු ය.

**මාධ්‍ය හැසිරීම -** සියලුම මාධ්‍ය මැතිවරණ කටයුතු ප්‍රවර්ධනය වෙනුවෙන් සිදුකරනු ලබන සියලු ක්‍රියාකාරකම් (ජනමාධ්‍ය වැඩසටහන් හා සමාජ මාධ්‍ය ක්‍රියාකාරීත්වය උදාහරණ සහිතව විස්තර කළ යුතු ය.)

**ප්‍රචණ්ඩත්වය** - මැතිවරණ සම්බන්ධ මාධ්‍ය වාර්තා කිරීම් හේතුවෙන් ඇතිවන ගැටලුකාරී තත්ත්වයන් ( පුද්ගල හා සමාජ ගැටුම්) උදාහරණ සහිතව පැහැදිලි කළ යුතු ය.

5. (i) මහජන සම්බන්ධතා මෙවලම් දෙකක් හා විධි ක්‍රම දෙකක් නම් කරන්න

| **මෙවලම්** | **විධි ක්‍රම** |
|---|---|
| ප්‍රවෘත්ති නිවේදන (News Release) | තෑගි ලබා දීම (Complements) |
| මාධ්‍ය කට්ටල (Media Kit) | සම්මාන පිරිනැමීම (Awards) - |
| විස්තර පත්‍රිකා (Leaflets) | දිරි දීමනා (Incentives) - - |
| පොත් පිංච (Booklets) | උපදේශනය (Advocacy) - - |
| පුවත් හසුන් (News Letter) | අරමුදල් ලබා දීම (Funds) - - |
| වාර්ෂික වාර්තා (Annual Reports) | මහජන මතය විමසීම (Public Opinion search) - |

| | |
|---|---|
| ඡායාරූප (Photographs) | විශේෂ සිද්ධි කළමනාකරණය (Special Event Maígement) |

ද්විමාර්ගික නව මහජන සම්බන්ධතා මෙවලම්

- වීඩියෝ සම්මන්ත්‍රණ
- වීඩියෝ ප්‍රවෘත්ති
- අන්තර්ජාල මහජන සම්බන්ධතා

  Web casting/ websites/ email/ Social media networks
- විද්‍යුත් මාධ්‍ය කට්ටල
- විද්‍යුත් මාධ්‍ය මධ්‍යස්ථාන

(ii) මහජන සන්නිවේදනයේ ප්‍රයෝජන දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

- කිසියම් අරමුණක් සඳහා ජන සමූහයක් පොළඹවා ගැනීමට හැකිවීම
- ප්‍රස්තුත කරුණු පිළිබඳ වැඩිදුර දැනුවත් කිරීමක් සිදු කිරීම සඳහා යොදා ගත හැකි වීම
- ප්‍රතිරූප ගොඩ නංවා ගැනීමට උපකාර වීම
- කිසියම් මතයක් නිර්මාණය කිරීමට හේතු වීම
- විවිධ පාර්ශවවල අවධානය දිනා ගැනීමට හැකි වීම

(iii) මහජනතාවගේ පොදු සුභ සිද්ධිය සලසාදීම සඳහා මාධ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කරයි. රටක මාධ්‍ය ප්‍රතිපත්තියක අන්තර්ගත විය යුතු කරුණු තුනක් විස්තර කරන්න.

- මාධ්‍ය කර්මාන්තයේ හිමිකාරිත්වය
- තාක්ෂණික යටිතල පහසුකම් හා තාක්ෂණික සංවර්ධනය
- මහජනතාව සමඟ මාධ්‍ය සම්බන්ධතාව
- මාධ්‍ය අධිකාරීන් හා වෙළෙඳ පොළ නියාමනය

(iv) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය අන්තර්ගතයෙහි දැකිය හැකි නව ප්‍රවණතා හතරක් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

- සරල භාෂා භාවිතය
- වෙළෙඳ දැන්වීම් ප්‍රමාණාත්මක ව ඉහළ යාම
- ඉදිරිපත් කිරීමේ නව මාදිලි යොදා ගැනීම
- විනෝදාස්වාදය කෙරේ වැඩි අවධානයක් දැක්වීම

6. (i) ශ්‍රවන්විදුලි මාධ්‍ය භාෂාවේ විශේෂතා හතරක් නම් කරන්න.

- ශ්‍රව්‍ය ගෝචර භාෂාවක් යොදා ගැනීම
- පරිකල්පනීය භාෂාවක් වීම
- කෙටි වාක්‍ය භාවිත කිරීම
- එකවර සවන්දීමෙන් ග්‍රහණය කරගත හැකි වීම
- සංඛ්‍යා දත්ත අවම ලෙස භාවිතය හා අවශ්‍ය ම අවස්ථාවල ආසන්න ලෙස දැක්වීම
- පැහැදිලි නිරවුල් භාෂාවක් භාවිත කිරීම

(ii) ඔබ කැමති ජනමාධ්‍යයක් ඇසුරෙන් සන්නිවේදන මූලිකාංග දෙකක් නිදසුන් සහිත ව විස්තර කරන්න

- සන්නිවේදකයා
- සන්දේශය
- මාධ්‍යය
- ග්‍රාහකයා
- ආකේතකරණය
- විකේතකරණය
- බලපෑම
- ප්‍රතිපෝෂණය
- අද්දැකීම් පසුතලය
- සන්දර්භය
- බාධක/ ඝෝෂා

(iii) ජනශ්‍රැතිකාංග තුනක් නම් කර ඒවා රූපවාහිනී වැඩසටහනක් සම්පාදනයේදී යොදාගත හැකි ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

- ජන කවි
- ජන කතා
- ජන ක්‍රීඩා
- ජන ඇදහිලි, ජන ඇදහිලි, ජන විශ්වාස, කෙම් ක්‍රම
- අභිචාර
- ජන සංගීතය
- ජන උත්සව
- ජන ප්‍රවාද
- පුරාණෝක්ති

- ප්‍රස්ථාව පිරුළු
- යාතුකර්ම
- අධි විශ්වාස

(ඉහත ජනශ්‍රැතිකාංග රූපවාහිනී වැඩසටහනක් සඳහා යොදාගන්නා ආකාර උදාහරණ සමග පැහැදිලි කර තිබිය යුතුයි)

(iv) පාසල් නායකත්ව පුහුණු කඳවුරක දී සිද්ධි කළමනාකරණය යොදාගත හැකි අයුරු පහත කරුණු ඔස්සේ පැහැදිලි කරන්න

(අ) අයවැය තීරණය කිරීම
(ආ) අනුග්‍රාහකත්වය
(ඇ) සෞඛ්‍ය හා ආරක්ෂණ විධි
(ඈ) අවදානම් තක්සේරු කිරීම

**(අ) අයවැය තීරණය කිරීම**

පුහුණු කඳවුරට අදාළ කටයුතු සඳහා මුදල් උපයා ගන්නා ආකාරය හා වියදම් කරන ආකාරය පිළිබඳ ව පැහැදිලි කර තිබිය යුතු ය.

**(ආ) අනුග්‍රාහකත්වය**

පුද්ගලයින් සහ ආයතන සමග සම්බන්ධතා ගොඩනගාගෙන කාර්යය ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය සේවා සහ පහසුකම් ගැලපෙන අයුරින් යොදා ගැනීම පිළිබඳ පැහැදිලි කර තිබිය යුතුය.

**(ඇ) සෞඛ්‍යය හා ආරක්ෂණ විධි**

- සුදුසු ස්ථානයක් සකසා ගැනීම
- හදිසි අවස්ථාවකදී සම්බන්ධ කර ගත හැකි ආයතන හා සේවා පිළිබඳ ලැයිස්තුවක් සකස් කර ගැනීම
- ප්‍රථමාධාර කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ සපයා ගැනීම
- ප්‍රථමාධාර පිළිබඳ දැනුම සහිත පුද්ගලයින් සම්බන්ධ කර ගැනීම
- අවශ්‍ය අවස්ථා සඳහා වෛද්‍ය පහසුකම් ලබා ගැනීම
- හදිසි අවස්ථා සඳහා ගිලන්රථ සූදානම් ව තබා ගැනීම

ආදී ගැලපෙන කරුණු ඇතුළත් කර විස්තර කර තිබිය යුතුය.

**(ඈ) අවදානම් තක්සේරු කිරීම**

- කාලගුණික දත්ත පිළිබඳ නිවැරදිව සොයා බැලීම
- කඳවුර පවත්වන ස්ථානය ඒ සඳහා යෝග්‍ය හා ආරක්ෂිත වීම
- අනතුරුදායක ස්ථාන සහ අනතුරු ඇතිවිය හැකි අවස්ථා අවම කර ගැනීම

- අවදානම් සඳහා මුහුණදීමට අවශ්‍ය පුද්ගල කණ්ඩායමක් හා භෞතික සම්පත් සූදානම් කර තබා ගැනීම
- ආපදා පිළිබඳ ලැයිස්තුවක් සකස් කිරීම

ආදී ගැලපෙන කරුණු ඇතුළත් කර විස්තර කර තිබිය යුතුය.

7. යම් ප්‍රදේශයක රසායනික කර්මාන්ත ශාලාවක් පිහිටුවීමට විරෝධය පාමින් ජනතාව ඒකරාශී වූහ.
(i) ග්‍රාමීය ජනතාව ඒකරාශි කර ගැනීම සඳහා භාවිතයට ගත හැකි මාධ්‍ය විධි ක්‍රම හතරක් නම් කරන්න

- පොස්ටර්
- අත්පත්‍රිකා
- ශබ්ද විකාශන යන්ත්‍ර
- පුද්ගලාන්තර සන්නිවේදන භාවිතයන්
- රැස්වීම්
- සමාජ මාධ්‍ය යෙදවුම් (WhatsApp වැනි සමූහ)

(ii) ජනතාවගේ විරෝධයට හේතු සෙවීමට සමීක්ෂණයක් සිදු කරන්නේ නම් එහි ඇති වාසි දෙකක් විස්තර කරන්න.

- කෙටි කාලයක දී දත්ත රැස් කිරීමට හැකි වීම
- වියදම අවම වීම
- දූරකථනය, අන්තර්ජාලය, තැපැල වැනි ක්‍රම භාවිත කරමින් දූරස්ථ ව සිටින අයගෙන් වුව ද දත්ත රැස් කිරීමේ හැකියාව.
- මාර්ගගත (Online) සමීක්ෂණ සිදු කිරීමේ දී ඒ සඳහා විශේෂිත මෘදුකාංග හා යෙදවුම්වලින් හෝ (App) ශ්‍රමායික ව දත්ත රැස් කිරීමටත් ඒවා විශ්ලේෂණය කිරීමටත් හැකි වීම.
- විශාල දත්ත සංඛ්‍යාවක් විශ්ලේෂණය කිරීමේ දී මෘදුකාංග භාවිතයෙන් ඒවායෙහි වලංගු භාවය, විශ්වසනීයත්වය, සංඛ්‍යාන විද්‍යාත්මක නිරවද්‍යතාව ආරක්ෂා කර ගනිමින් විවිධ විචල්‍ය අතර සහසම්බන්ධතාව පරීක්ෂා කර බැලීමේ හැකියාව ඇත.
- ආකල්ප, මතවාද, විශ්වාස, චර්යා රටා, සිදු වීම් හා වටිනාකම් යනාදිය පළිබඳ පුළුල් පරාසයක පවත්නා තොරතුරු එකවර රැස්කර ගැනීමේ හැකියාව ඇත.
- නිවැරදි ප්‍රමිතියට අනුව සමීක්ෂණ සිදු කිරීමෙන් දෝෂ අවම කර ගත හැකිය.

(iii) සමීක්ෂණයක දී දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලියක් සකස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් විස්තර කරන්න

- ගැටලුවට අදාළ විසඳුම් කරා එළඹීමට අවශ්‍ය දත්ත ලබා ගත හැකි වන පරිදි ප්‍රශ්නාවලිය සැකසීම
- එහි මූලික අරමුණට ගැළපෙන ආකාරයට ප්‍රශ්නාවලිය සැකසීම
- නිශ්චිත පිළිතුරු ලබා දීමට දත්ත දායකයාට පහසු වන ආකාරයට ප්‍රශ්නාවලිය සැකසීම
- අධ්‍යාපන මට්ටම, වයස් සීමාව, ආදායම් මටට්ම, භාෂාව යනාදි දත්ත දායකයන්ගේ ස්වභාවය හඳුනා ගෙන ඊට ගැළපෙන ආකාරයට ප්‍රශ්නාවලිය ගොඩනැගීම
- ඍජු පිළිතුරු නො ලැබෙති යි අපේක්ෂා කරන ප්‍රශ්න වක්‍ර ආකාරයෙන් විමසීම
- සීමා සහිත ප්‍රශ්න සංඛ්‍යාවක් ඇතුළත් කිරීම
- ප්‍රමුඛතාව අනුව ප්‍රශ්න පෙළ ගැස්වීම

(iv) ඉහත ගැටලුවට විසඳුම් සෙවීමේදී සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂා යොදා ගත හැකි ආකාරය පහත මාතෘකා යටතේ නිදසුන් සහිත ව පැහැදිලි කරන්න

(අ) සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය
(ආ) යහපත් පරිසරයක් ගොඩනැගීම

**සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය** (Participatory democracy)

1. ප්‍රජාතන්ත්‍රවාදී සවිඥානකත්වය ඉහළ දැමීම
2. ප්‍රජා සහභාගිත්වය වර්ධනය කිරීම

- විද්‍යුත් තාක්ෂණය භාවිත කිරීම මඟින් පුරවැසි සමාජ ක්‍රියාකාරීත්වය දියුණු කිරීම
- සාම්ප්‍රදායික සන්නිවේදන බාධාවන් මඟහරවා ගැනීමට 'අතථ්‍ය සන්නිවේදනය' (Virtual Communication) භාවිතයන් යොදා ගැනීම
- පුරවැසියන්ට ඔවුන්ගේ මත සම්බන්ධයෙන් දේශපාලන නියෝජිතයන් සමඟ සාකච්ඡා කිරීරීමට අවස්ථා සම්පාදනය
- ජනයා අතර අන්තර් ක්‍රියාකාරිත්වය අඛණ්ඩ ව පවත්වා ගෙන යාම සඳහා මාධ්‍ය භාවිත කිරීම

(ජනතාව සාමූහිකව සංවර්ධන ක්‍රියාවලිය සඳහා මැදිහත් කර ගැනීම උදාහරණ සහතිව විස්තර කළ යුතු ය.)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

**යහපත් පරිසරයක් ගොඩනැගීම** (Building a better environment)

පරිසර විද්‍යාත්මක සමබරතාව (Ecological balance) ගොඩනැගීම. (ජෛව ගෝලීය සමතුලිතතාව ඇති කිරීම)

- ආපදා කළමනාකරණය සඳහා සන්නිවේදනය ශක්තිමත් කිරීම
- පරිසර හිතකාමී ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම
- පාංශු සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- වනාන්තර විනාශ කිරීම වැළැක්වීම
- රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

PAST PAPERS WIKI


(29) WWW.PastPapers.WiKi (29)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න